# වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

# 2022

## කාර්යසාධන වාර්තාව

අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය

# කාර්යසාධන වාර්තාව 2022

## වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
## වැය ශීර්ෂ අංකය : 161

# පටුන


| | | |
|---|---|---|
| | | පිටුව |
| **පරිච්ඡේදය 01** - | ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | **11** |
| **පරිච්ඡේදය 02** - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | **19** |
| **පරිච්ඡේදය 03** - | වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | **27** |
| **පරිච්ඡේදය 04** - | කාර්යසාධන දර්ශක | **35** |
| **පරිච්ඡේදය 05** - | තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | **35** |
| **පරිච්ඡේදය 06** - | මානව සම්පත් පැතිකඩ | **36** |
| **පරිච්ඡේදය 07** - | අනුකූලතා වාර්තාව | **39** |

## වනජීවී හා වන සම්පත් සංරක්ෂණ ගරු අමාත්‍යතුමියගෙන්.......

ජෛව විවිධත්වය අතින් ලෝකයේ අන් කිසිම රටක් ශ්‍රී ලංකාව අභිබවා නොයයි. එවැනි රටක වනජීවී හා වන සංරක්ෂණය යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් ක්‍රියාවට නැංවීම සඳහා දායක වීමට ලැබීම මා ලද භාග්‍යයක් සේ සලකමි.

2022 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා රටේ පැවති දැඩි ආර්ථික දුෂ්කරතා හමුවේ වුවද අප අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන සමග එක්ව වනජීවීන්ගේ ආරක්ෂාව සහ වන සංරක්ෂණ කටයුතු හා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමත් නොකඩවා සිදුකර ඇත. එසේම රටෙහි දළ ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සංචාරක කර්මාන්තය ඔස්සේ සෘජු ලෙස දායකත්වය ලබාදීමට හැකි වී තිබීම ගැන මම බෙහෙවින් සතුටු වෙමි. ඒ අනුව 2022 වර්ෂය තුල රු.මි 2493.8 ආදායමක් ජාතික ආදායමට එකතු කර දීමට හැකිවී තිබේ.

අප රටේ දිස්ත්‍රික්ක 19 කට හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 133ක් සඳහා බලපාන ප්‍රශ්නයක් වන අලි මිනිස් ගැටුම වෙනුවට අලි මිනිස් සංහිඳියාව ඇති කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව දිවා රෑ නොබලා කටයුතු කරමින් සිටී. අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලි වැට ඉදිකිරීම, මෙන්ම වන අලින්ට නිදහසේ සංචරණය කිරීමට බාධාවන් වී ඇති අලිමංකඩ කඩිනමින් නිදහස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර වන සතුන්ට අවශ්‍ය ජලය, ආහාර ලබා ගැනීම සඳහා වාසස්ථාන සුපෝෂණ කටයුතු නොකඩවා සිදුකරනු ලැබේ. ජාතික උද්‍යාන වලට පැමිණෙන සංචාරකයින්ගේ පහසුව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇත.

ශ්‍රී ලංකාවේ වන වැස්ම 30% දක්වා ඉහළ නංවා ගැනීමේ අභියෝග ජය ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් සිටියි. හරිත ආවරණය පුළුල් කිරීමේ අරමුණින් වානිජ වන වගා ස්ථාපනය, පරිණත වන වගා හෙලීම් කර ස්ථාපිත වන වගා නඩත්තුව, අත්හැර දමන ලද ගෙවතු වනාන්තර බවට පත් කළ ඉඩම් නඩත්තුව, වගුරු බිම් හා කඩොලාන පද්ධති සංරක්ෂණය, වැනි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කෘෂි වන වගා වැඩසටහන් ප්‍රචලිත කිරීමටත්, හායනයට පත් වනාන්තර ඉඩම් ග්‍රාමීය ප්‍රජාව සමග ගිවිසුම් යටතේ ලබාදී වන වගාව සමග කෘෂිකාර්මික භෝග සහිතව කෘෂි වන වගා ඇති කිරීම ,වන වගා සමග වසර කිහිපයක් ආහාර භෝග වගාව ප්‍රචලිත කිරීම තුලින් ප්‍රජාව සමග සහභාගිත්ව කළමනාකාරිත්වයට ඉඩ අවස්ථා ඇති කිරීමට කටයුතු කර ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සතුන් සංරක්ෂණය කරමින් හා සතුන් ප්‍රදර්ශන කටයුතු කරමින් රටට විශාල ආදායමක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. නමුත් 2022 පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ විදේශ සංචාරකයන් පැමිණීම අඩුවීම පින්නවල අලි අනාථාගාරයට ආදායම් අඩුවීම ප්‍රබල ලෙස බලපා ඇත. තවද රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ ආහාර

වල මිල සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් සතුන්ට ආහාර ලබාදීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ප්‍රධාන අභියෝගයකට මුහුණ දීමට සිදුවී ඇත. මෙම අභියෝගය ජය ගැනීම සඳහා සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා දියගම හා කහපොළ ගොවිපොළවල් ආරම්භ කර ඇත. එසේම පවතින සත්වෝද්‍යාන වලට අයත් ඉඩම් තුල සතුන්ට අවශ්‍ය තණකොළ නිෂ්පාදනය ආරම්භ කර ඇත. සත්ත්ව සවිය නමින් කැපකරු ක්‍රමයක් ද හඳුන්වා දී ඇති අතර මේ තුලින් සත්ව ලෝලීන්ට සතුන්ගේ ආහාර සඳහා දායකවීමේ අවස්ථාව එමගින් ලබාදී ඇත.

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීම සඳහාත් පාරිසරික සංරක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කර ගැනීම සඳහාත් අවශ්‍ය වැඩසටහන් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක කරමින් සිටී. ව්‍යාපෘතිය මගින් රක්ෂිත ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ද පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කරමින් දෙස් විදෙස් සංචාරකයන්ට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ද කටයුතු කරයි. එසේ ම වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල ධාරිතා සංවර්ධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අවශ්‍ය වැඩසටහන් ද දියත් කර ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය දැව සංස්ථාව ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ වෙළඳපොළෙහි සැබෑ නායකත්වය ලබාගැනීමේ අරමුණින් යුතුව කටයුතු කරයි. රාජ්‍ය දැව සංස්ථාව මගින් අපනයනය කෙරෙන දැව කඳන් වෙනුවට අගය එකතු කර අපනයනයට කටයුතු කිරීමෙන් විදේශ විනිමය ඉහළ නංවා ගැනීම සඳහා කටයුතු කරනු ඇත.

ගහකොළ සතා සිව්පාවා මෙන්ම ලොව සුන්දරම රටවල් අතරට එක්වන මෙරට ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමේ ප්‍රමුඛ වගකීම දරන මෙම අමාත්‍යාංශයේ සියලු කාර්යභාරයන් සඳහා සහයෝගීව කටයුතු කරනු ලබන වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය වන ආර්.එම්.සී.එම් හේරත් මහත්මියටත් මෙම ප්‍රගති වාර්තාව සකස් කිරිමට අවශ්‍ය තොරතුරු සපයාදුන් දෙපාර්තමේන්තු වල හා ආයතන වල සියළුම නිලධාරීන්ට හා පරිවර්තන කටයුතු සිදුකිරීමට අවශ්‍ය සහයෝගය ලබාදුන් කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කරමි.

නිතිඥ පවිත්‍රා වන්නිආරච්චි
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය

## වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමියගෙන්..........

වනජීවී ආරක්ෂණය හා වන සංරක්ෂණයට මූලිකත්වය දෙමින් අදාළ ප්‍රතිපත්ති අණපනත්වලට අනුකූලව මිනිසාට වඩාත් සංවේදී වන ගහ කොළ ,සතා, සිව්පාවා ආරක්ෂා කර ගැනීමේ මහගු මෙහෙවරට නායකත්වය ලබාදෙන වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාවට පණිවිඩයක් එක් කිරීමට ලැබීම පිළිබඳව සතුටු වෙමි.

මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන වනජීවී සංරක්ෂණ, වන සංරක්ෂණ, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු තුන මෙන්ම රාජ්‍ය දැව සංස්ථාව හා පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් විශාල කාර්ය භාරයක් මේ වන විට ඉටු කරමින් සිටියි.

වනසතුන් හා මානව ප්‍රජාව සමග අන්‍යොන්‍ය සහ සම්බන්ධතාවය හා අවබෝධය ඇති කිරීම සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම, ප්‍රජා පාදක සමිති හරහා රක්ෂිත ආශ්‍රිත ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය උදෙසා මී මැසි පාලනය, කිරි ගවයින් පාලනය වැනි ස්වයං රැකියා උත්පාදනය කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම් සිදුකර ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නංවා ගැනීමට කටයුතු කිරීම, ජෛව විවිධත්වය සහිත පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටියි.

ලංකාවේ දිස්ත්‍රික්ක 19කට හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 131කට බලපා ඇති ප්‍රධාන අභියෝගයක් ලෙස අලි-මිනිස් ගැටුම දැනට දැවෙන ප්‍රශ්නයක් වන අතර අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා විදුලි වැට ඉදිකිරීම හා දැනට පවතින විදුලිවැටවල් නඩත්තු කිරීමේ කටයුතු සිවිල් ආරක්ෂක බලකාය සමග එක්ව කරගෙන යනු ලබයි. මේ වන විට පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය හා එක්ව කුරුණෑගල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල ග්‍රාමීය විදුලිවැටවල් 26 ක් ඉදි කර ඇති අතර තවත් විදුලි වැටවල් 13 ක ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. තවද, හණ වගාව වැනි ස්වභාවික උපක්‍රම මගින් අලි වැට ඉදිකිරීම වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් සිටියි. මොනරුන් , රිලව්, වඳුරන් වැනි වන සතුන්ගෙන් ගොවිබිම් වලට වන හානිය වළක්වාලීම සඳහා පලතුරු ගස් සිටුවීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

සමාජ හා පාරිසරික ප්‍රතිලාභ තිරසාරව ලබා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රශස්ථ වන ආවරණයක් සංරක්ෂණය කිරීම සඳහා සහ ප්‍රජා සහභාගිත්වයෙන් වන රෝපණය කිරීම තුලින් හරිතාවරණය පුළුල් කරමින් 2025 වන විට වන ආවරණය 30% දක්වා වැඩි කිරීමේ ඉලක්කගත වැඩසටහන සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මූලාරම්භය සපයා ඇත. එසේම අවශ්‍ය අවස්ථාවලදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් වගා කටයුතු සඳහා නිදහස් කරමින් රටේ දැවෙන ආහාර අර්බුදයෙන් මිදීමට සහාය ලබාදීමට කටයුතු කරමින් සිටියි.

එසේම පවතින රක්ෂිත ආරක්ෂා කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ලෙස ගොවීන්ට වගා භූමි ලබාදීමත් අරමුණු කර ගනිමින් ලංකාවේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ එකඟතාවය ඇතිව සිතියම් සකස් කර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු ආරම්භ කර තිබෙන අතර ලංකාවේ වන ගහනය වැඩි දිස්ත්‍රික්ක 10ක් තෝරාගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ භූමිය ඇතුලත් කර සිතියම් සකස් කිරීමටද අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටියි.

සත්ත්ව සංරක්ෂණයට මුල්තැන දෙමින් සතුන්ට උපරිම රැකවරණය සලසන ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සතුන්ට උපරිම රැකවරණය හා පහසුව ඇති වන පරිදි ඔවුන්ගේ වාසස්ථාන පුළුල් කිරීම, නරඹන්නන් සඳහා උපරිම පහසුකම් ලබා දෙමින් සංචාරක ආකර්ෂණය ලබා ගැනීම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතරම, රිදියගම සෆාරි උද්‍යානයේ සුරතල් සත්ත්ව අරණ මේ වසර තුල විවෘත කරමින් ලෝකයේ විශිෂ්ඨතම සත්වෝද්‍යාන පවත්වාගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීමේ ඉලක්කගත අරමුණින් යුතුව ක්‍රියා කරමින් සිටියි. තවද, සත්ත්ව ලෝලීන් හට තමන් කැමති සත්වයකු ගේ සුභසාධන කටයුතු සඳහා " සත්ත්ව සවිය" කැපකරු ක්‍රමය ද හඳුන්වාදී ඇත. එසේම සතුන් සඳහා ආහාර සපයා ගැනීමේ දුෂ්කරතාවය පවතින ආර්ථික අර්බුදය ජාතික සත්වෝද්‍යානයට තදින් බලපා ඇති අතර එම ගැටළු විසඳා ගැනීම සඳහා කහපොළ හා දියගම තණ වැවීමේ ව්‍යාපෘති ආරම්භ කර ඇත.

එසේම, අමාත්‍යාංශය යටතේ පවතින එකම ව්‍යවස්ථාපිත ආයතනය වන රාජ්‍ය දැව සංස්ථාව ජාතියේ විශ්වසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරු වීම සහ වෙළඳපොළෙහි සැබෑ නායකත්වය ලබාගැනීමේ අරමුණින් යුතුව පවතින වර්තමාන තත්ත්වය තුල ආර්ථික අර්බුදතාවයන් මධ්‍යයේ වුවද මෙම වර්ෂයේ **2022.12.31** දින වන විට රු.මි. **5265.00** ක ආදායමක් ලබාදීමට සමත්වී ඇත.

අමාත්‍යාංශයේ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුලින් ආදායම් තත්වය වැඩි දියුණු කිරීමට හැකි සෑම අයුරකින්ම සහාය ලබාදීමට අමාත්‍යාංශය කටයුතු කිරීමට බලාපොරොත්තුවේ. එස්ම ,මෙම දෙපාර්තමේන්තු ත්‍රිත්වය මගින් **2022.12.31** දින වන විට රු.මි. **2493.8**ක සංචාරක අදායමක් ඉපයීමට සමත්ව ඇත.

ගොඩබිම, ගුවන මෙන් මුහුදේද නිහඬ සැරිසරන්නන් වන වනජීවීන් මෙන්ම රටේ සුන්දරත්වය ආරක්ෂා කරමින් ජෛව විවිධත්වය රැක ගැනීමේ මහගු මෙහෙවරකට නායකත්වය ලබා දෙමින් භාරදූර කාර්ය භාරයක් ඉටු කිරීම සඳහා නායකත්වය ලබාදෙමින් කටයුතු කරනු ලබන ගරු වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය වෙත මාගේ හෘදයාංගම පූර්වක ස්තුතිය පල කරමි. ප්‍රගති වාර්තාව සකස් කිරීම සඳහා තොරතුරු ලබාදුන් සියලුම දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන්ටත්, අනෙකුත් සියලුම නිලධාරීන්ට හා භාෂා පරිවර්තන කටයුතු කර දුන් නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පුද කරමි.

ආර්.එම්.සී.එම් හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

# 1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

**2020.08.09** දිනැති අංක **2187/27** දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පිහිටුවන ලද වනජීවී රැකවරණ, අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුලු වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති දෙපාර්තමේන්තු වන වනජීවී සංරක්ෂණ, වන සංරක්ෂණ, ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු **2022.03.08** දිනැතිව අංක **2270/14** දරණ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාංශය යටතට ඇතුලත් කරන ලදී. ඒ අනුව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතට පෙර පැවති දැව සංස්ථාව හා පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතියට අමතරව අදාළ දෙපාර්තමේන්තු වල කාර්යය භාරයද පැවරිණි.

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට වනජීවී ආරක්ෂණ හා වන සංරක්ෂණය සඳහා අදාළ ප්‍රතිපත්ති, අණපනත් වලට අනුකූලව මිහිතලයට වඩාත් සංවේදී වන ගහකොළ සතා සිව්පාවා ආරක්ෂා කිරීමේ වගකීම භාරවී ඇත.එමගින් ජෛව විවිධත්වය හා වන සම්පත රැක ගැනීමේ විශාල කාර්ය භාරයක් සිදුකිරිමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්වීම මෙම අමාත්‍යාංශයෙන් සිදුකරනු ලබයි.

එසේම, රාජ්‍ය දැව සංස්ථාව මඟින් ජාතියේ විශ්වසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරු බවට ඉදිරි පස් වසර තුල පත්වීමට අවශ්‍ය නායකත්වය සැපයේ. සංවේදී වන වගාවන් තුළින් ජාතික වන වැස්ම පුළුල් කිරීම හා වන සතුන් ජීවත්වන ස්වභාවික පරිසරය සංරක්ෂණය කරමින් අනාගත පරපුරට දායාද කිරීමට කටයුතු කිරීමේ වගකීමද අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

## 1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

### දැක්ම

"වනජීවීන් හා වන සම්පත සුරැකි තිරසර දේශයක්"

### මෙහෙවර

" වනජීවී හා වන සංරක්ෂණය මගින් ජෛව විවිධත්වය පෝෂණය කිරීම අරමුණු කරගනිමින් ස්ථානීය වෘක්ෂලතා සංරක්ෂණය සහ ස්ථානීය හා පරිබාහිර සත්ත්ව සංරක්ෂණය ද තිරසර දැව කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, නියමු ආයතන සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය සැපයීම"

## 1.3 ප්‍රධාන කාර්යයන් හා විෂය පථය

### විෂයපථය

වනජීවී හා වන සම්පත් සංරක්ෂණය මගින් ජෛව විවිධත්වය පෝෂණය කිරීම හා පරිසර සංවේදී වන වගාවන් තුළින් ජාතික වන වැස්ම පුළුල් කිරීම හා වන සතුන් ජීවත්වන ස්වාභාවික පරිසරය සංරක්ෂණය කිරීම.

### කාර්යයන් හා කර්තව්‍යයන්

1. රජය මගින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "වනජීවී ආරක්ෂණය හා වන සංරක්ෂණය" ඇති කිරීම සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වනජීවී හා වන සංරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
2. ජාතික අයවැය , රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම .
3. අමාත්‍යාංශ විෂය යටතට අයත් ආයතනයන්හි විෂයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති , වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරිම හා ඇගයීම.


### සුවිශේෂී ප්‍රමුඛතා

1. වන ජීවීන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වනෝද්‍යාන, ජලාශ හා වන සතුන්ගේ ආහාර භෝග වගා පුළුල් කිරීම.
2. වන සතුන්ගෙන් ග්‍රාමීය පළාත් වල නිවාස, දේපළ හා වගාවන් සඳහා වන හානි අවම කර ගැනීමේ නවීන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම.
3. අලි මිනිස් ගැටුම් වැළකෙන පරිදි එම අවදානම් ප්‍රදේශවල අලිවැට , අගල් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් වලට සමගාමීව ප්‍රජා මූල ආරක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.

4. වන වගාවන් පුළුල් කිරීම මඟින් වන ඝනත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා ගෙවතු මට්ටමේ මෙන්ම පාසැල්, රෝහල්, කාර්යාල,වැඩපළවල් හා මාර්ග අවම ප්‍රදේශ වල මෙන්ම නාගරික උද්‍යාන වල වන වගාව හඳුන්වාදීම හා පුළුල් කිරීම.

5. හරිත ආවරණය පුළුල් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. වගුරු බිම් හා කඩොලාන පද්ධති සංරක්ෂණය කරමින් ඒවා විනාශ කරන මානව ක්‍රියාකාරකම් පාලනය කිරීම
7. සෝදාපාලු හා නිසරු බිම් හඳුනාගෙන, පොල් , වෙනත් බෝග,තෘණ හා කෘෂි වන වගා උද්‍යාන ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම
8. කර්මාන්තශාලා ආශ්‍රිතව වන වගා තීරු, නාගරික රුක් ගොමු ,අධිවේගී හා මහා මාර්ගද ඇතුළත්ව මග දෙපස රුක්රෝපණ, රජයේ කාර්යාල ආශ්‍රිත ඉඩම්, මහල් නිවාස ආශ්‍රිත රුක් වගා, තුරු උයන් හා ගෘහාශ්‍රිත කෘෂි වන වගා දිරිගැන්වීම
9. කැලෑ නැවත වගා කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
10. ගංගා ආශ්‍රිත හා භූමිය ආශ්‍රිත නිශ්චිත වැලි කැණීම් තීරු ස්ථාපනය කිරීම හා ගංගා නිම්න සංවර්ධනය
11. හරිත සහ සුහුරු නගර හා වාසස්ථාන සංකල්පය ඇති කිරීම හා ප්‍රචලිත කිරීමත්, පාරිසරික සංවේදී ජනතාවක් බිහිකිරීම සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
12. වනජීවීන්ගේ රැකවරණය සඳහා එවුන්ට වෙන්වූ භූමි ආරක්ෂා කිරීම, එම ප්‍රදේශවල වැව් ගංගා හා කැලෑ සංවර්ධනය කිරීම හා වන සතුන්ගේ ආහාර ප්‍රවර්ධනයට අවශ්‍ය වගාවන් ඇති කිරීම
13. සත්ත්ව සුභසාධනය හා සංරක්ෂණ කටයුතු සිදුකිරීම

## 1. 4. සංවිධාන සටහන



ලේකම්
සම්බන් ධීකරණ ලේකම්
අති. ලේකම් (පාලන) SLAS (විශේෂ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් SLAS (III/ II)
නීති නිලධාරි. Dept. (III/II)
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
තොරතුරු තාක්ෂණ නිලධාරි
ප්‍රධාන ඉංජිනේරු SLEg.S(I)
යාන්ත්‍රික ඉංජිනේරු. SLEgS (III/II)
අති. ලේකම් (සංවර්ධන) SLAS (විශේෂ ශ්‍රේණිය)
අධ්‍යක්ෂ සංවර්ධන SLAS (I)
අධ්‍යක්ෂ ජනරාල් SLPS (විශේෂ ශ්‍රේණිය)
අධ්‍යක්ෂ (සැලසුම්) SLPS (I)
නි/ සහකාර අධ්‍යක්ෂ SLPS
අති.ලේකම් (තාක්ෂණ) SLScS (විශේෂ ශ්‍රේණිය)
අති. ලේකම් (ව්‍යාපෘති) SLScS(විශේෂ ශ්‍රේණිය) SLSS
ප්‍රධාන මූල්‍ය නිලධාරි SLAcS (විශේෂ ශ්‍රේණිය))
ප්‍රධාන ගණකාධි කාරී SLAcS
ගණකාධි කාරී SLAcS (III/II)
ප්‍රධාන අභ්‍යන්තර විගණක SLAcS(I)
අභ්‍යන්තර විගණක SLAcS (III/II)
අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන) SLAS
නියෝජ්‍ය විගණන SLAdS (special)
අධ්‍යක්ෂ SLScS (1)02
වන සංරක් ෂකslsc s (1)01
විගණන අධිකාරි(slads 3 –02)
පොලිස් අධිකාරි (police & regula- tory

## 1.5 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන හා ව්‍යාපෘති

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- රාජ්‍ය දැව සංස්ථාව
- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

## 1.5.1 අමාත්‍යාංශයේ කාර්යභාරය ක්‍රියාත්මක කරන අංශ

### 1.5.1.1 පාලන අංශය

මානව සම්පත් කළමනාකරණය හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම තුළින් අමාත්‍යාංශයේ අරමුණු ඉටු කරවා ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම, අමාත්‍යාංශයේ පරිපාලනය හා විනය පවත්වාගෙන යාම, අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ගේ ආයතන කටයුතු සිදු කිරීම හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභා, පාර්ලිමේන්තු ප්‍රශ්න හා අමාත්‍ය මණ්ඩල සංදේශ වලට අදාළ කටයුතු සිදු කිරීම පාලන අංශයෙන් සිදුකරනු ලබයි.

### 1.5.1.2 සැලසුම් අංශය

වනජීවී ආරක්ෂණය ,වන සංරක්ෂණය හා සත්ව සුබසාධනය යන විෂයට අදාළව සැලසුම් හා අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් මෙම අංශය වගකියනු ලබයි. එසේම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම ද මෙම අංශයෙන් සිදුකෙරේ .

### 1.5.1.3 සංවර්ධන අංශය

වනජීවී සංරක්ෂණ ,වන සංරක්ෂණ , ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවල හා රාජ්‍ය දැව සංස්ථාව, පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතියට අදාල සංවර්ධන කටයුතු නියාමනය සහ අධීක්ෂණය මෙම අංශයෙන් සිදුකෙරේ.

### 1.5.1.4 ගිණුම් අංශය

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස ඉටු කළ යුතු අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශ විෂය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කාර්යභාරයට අවශ්‍ය සෘජු සහාය දැක්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය හා කර්තව්‍යයි. ඒ අනුව, අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම මෙහෙයවීම හා ඊට අදාළ පාලන කටයුතු මෙම අංශය මගින් ඉටු කරනු ලබයි.

### 1.5.1.5 තාක්ෂණ අංශය

වනජීවී , වන සංරක්ෂණ හා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු හා ආයතන සම්බන්ධව ඇති විද්‍යාත්මක සහ තාක්ෂණික කටයුතු සඳහා සහාය වීම සහ එම කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය මෙම අංශය මගින් සිදු කෙරේ.

### 1.5.1.6 අභ්‍යන්තර විගණන අංශය.

අමාත්‍යාංශයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රමවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඇගයීම සඳහා නිරන්තර සෝදිසි පරික්ෂණ සිදු කිරීම හා දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් විශේෂ පරික්ෂණ කටයුතු මෙහෙයවීම ද අභ්‍යන්තර විගණන අංශයෙන් සිදුකරනු ලබයි.

### 1.5.1.7 ව්‍යාපෘති අංශය

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයට අදාලව සිදුකෙරෙන මාධ්‍ය තොරතුරු නිවැරදි කිරීමට කටයුතු කිරීම, අදාල ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම මෙම අංශයෙන් සිදුකෙරේ.

### 1.5.1.8 නීති අංශය.

අමාත්‍යාංශයේ විෂය පථයට අයත් දෙපාර්තමේන්තු/සංස්ථාවල නෛතික කටයුතු වල දී නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම සහ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හා ලේකම් පාර්ශවකරුවකු කරමින් පවරන හා පවත්නා නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ

**1. 6 වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු/ආයතන හා ව්‍යාපෘතිවලට අදාල සමස්ථ ප්‍රතිපාදන සාරාංශය(2022.12.31 දිනට)**

| ආයතනය | මූලධන (රු.මි.) | | | | | පුනරාවර්තන(රු.මි) | | | මූලධන + පුනරාවර්තන මුළු එකතුව (රු.මි) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකාබද්ධ අරමුදල | විශේෂ අයවැය යෝජනා | දෙපාර්තමේන්තු අරමුදල | විදේශ අරමුදල් | මූලධන එකතුව | ඒකාබද්ධ අරමුදල | දෙපාර්තමේන්තු අරමුදල | පුනරාවර්තන එකතුව | |
| වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 10.40 | *1000.00 | | | 1010.40 | 270.10 | | 270.10 | 1280.5 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 227.00 | | 401.17 | | 628.17 | 2029.00 | 1710.99 | 3739.90 | 4368.07 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 566.00 | | 70.00 | | 656.0 | 1643.00 | | 1396.00 | 2299.00 |
| ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 180.00 | - | 76.02 | | 256.02 | 569.00 | 827.00 | 1396.00 | 1652.02 |
| පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය | - | - | - | 1426.70 | 1426.70 | | | | 1426.70 |
| රාජ්‍ය දැව සංස්ථාව | | | 1151.49 | | 1151.49 | | 4468.00 | 4468.00 | 5619.49 |
| එකතුව (රු.මි.) | 983.40 | 1000.00 | 1698.66 | 1426.70 | 5128.78 | 4511.10 | 7005.99 | 11270.00 | 16645.78 |

* අමාත්‍යාංශය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රු.මි. 600 හා අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රු.මි. 400)

# 2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල සංවර්ධන වැඩසටහන් මූලා‍ය ප්‍රගති සාරාංශය -2022

### (අ) ඒකාබද්ධ අරමුදල

| ආයතනය | ප්‍රතිපාදන (රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) | වියදම % |
|---|---|---|---|
| වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | **10.4** | **5.2** | **48** |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | **227.0** | **148.00** | **65** |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | **566.0** | **393.38** | **69** |
| ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | **180.00** | **145.91** | **81** |
| පරිසර පද්ධති සංරක්ෂණ හාකළමනාකරණ ව්‍යාපෘතිය | 1426.0 | **1301.62** | **91** |
| එකතුව | **2409.4** | **1994.11** | **82** |

### (ආ) විශේෂ අයවැය යෝජනා

| ආයතනය | ප්‍රතිපාදන (රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) | වියදම % |
|---|---|---|---|
| වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය + වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | **600.00** | **509.38** | **86** |
| වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය + වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | **400.00** | **300.00** | **75** |
| එකතුව | **1000.00** | **809.38** | **80** |

### (ඇ) දෙපාර්තමේන්තු අරමුදල්

| ආයතනය | ප්‍රතිපාදන (රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) | වියදම % |
|---|---|---|---|
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | **401.17** | **147.98** | **37** |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව(කැලෑ දෙපාර්තමේන්තු අරමුදල) | **70.0** | **47.81** | **68** |
| ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | **76.02** | **24.21** | **32** |
| එකතුව | **547.19** | **220.0** | **40.2** |

## 2.2 ආයතන ප්‍රගති සාරාංශය 2022.12.31 දිනට

### 2.2.1 රාජ්‍ය දැව සංස්ථාව මූල්‍ය ප්‍රගතිය

| ආයතනය | මූලධන ප්‍රතිපාදන (රු.මි) | සත්‍ය වියදම (රු.මි) | පුනරාවර්තන ප්‍රතිපාදන (රු.මි) | සත්‍ය වියදම (රු.මි) |
|---|---|---|---|---|
| රාජ්‍ය දැව සංස්ථාව | 1151.50 | 24.00 | 5248.00 | 3057.00 |

### 2.2.2 රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදන ප්‍රගතිය

| ප්‍රධාන සංරචකය | 2022 වාර්ෂික ඉලක්කය | 2022.12.31 දිනට ප්‍රගතිය | ප්‍රගතිය % |
|---|---|---|---|
| කඳන් (ඝ.මි) | 107,619 | 103,121 | 96 |
| සිල්පර (ඒකක) | 29,230 | 34,113 | 117 |
| ගෘහ භාණ්ඩ (රු.මි) | 255 | 292 | 115 |
| විදුලි කණු (ඒකක) | 1,277 | 1,837 | 144 |
| ඉරුදැව (ඝ.මි) | 8,728 | 3,432 | 39 |
| වට කණු (ඒකක) | 29,410 | 74,066 | 252 |
| වැට කණු (ඒකක) | 30,377 | 84,911 | 280 |
| අලිවැට කණු (ඒකක) | 17,690 | 10,448 | 59 |
| දර (ඝ.මි) | 40,482 | 93,785 | 232 |

### 2.2.3 රාජ්‍ය දැව සංස්ථාව අලෙවි ආදායම 2022.12.31 දිනට

| ප්‍රධාන සංරචකය | 2022 වාර්ෂික ඉලක්කය(රු.මි) | 2022.12.31 දිනට ඉලක්කය (රු.මි) | 2022.12.31 දිනට ප්‍රගතිය (රු.මි) | ප්‍රගතිය % |
|---|---|---|---|---|
| කඳන් (රු.මි) | 3,263.0 | 3,263.0 | 3,623.0 | 111 |
| සිල්පර (රු.මි) | 301.6 | 301.6 | 603.0 | 200 |
| ගෘහ භාණ්ඩ (රු.මි) | 439.0 | 439.0 | 427.0 | 97 |
| විදුලි කණු (රු.මි) | 14.5 | 14.5 | 33.0 | 228 |
| ඉරුදැව (රු.මි) | 1243.0 | 1243.0 | 372.0 | 30 |
| වට කණු (රු.මි) | 5.0 | 5.0 | 12.0 | 240 |
| වැට කණු (රු.මි) | 7.0 | 7.0 | 12.0 | 171 |
| අලිවැට කණු (රු.මි) | 109.5 | 109.5 | 71.0 | 65 |
| දර (රු.මි) | 25.0 | 25.0 | 69.0 | 276 |
| වෙනත් | | | 43.0 | |
| එකතුව | 5408.0 | 5408.0 | 5,265.0 | 97 |

## 2.3 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය - මූල්‍ය ප්‍රගතිය

| ආයතනය / ව්‍යාපෘති | 2022.01.01 2022.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි) | 2022.01.01 2022.12.31 දිනට සත්‍ය වියදම (රු.මි) | % |
|---|---|---|---|
| පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය | 1426.0 | *1301.62 | 29 |

*ව්‍යාපෘතියේ ඉහත සදහන් රු.මිලියන **1,301.62**ක වියදම් ප්‍රමාණය (විදේශීය හා දේශීය අරමුදල් යටතේ) මුදල් පදනම මත ගණනයකර ඇති අතර මහා භාණ්ඩාගාරය විසින් වියදම ලෙස වාර්තා කරනුයේ ව්‍යාපෘතිය මගින් **2022** වසරට අදාලව යොමු කරනු ලබන ආපසු ගැනීමේ අයදුම්පත්වල **(Withdrawal Applications)** එකතුව වේ. එම වටිනාකම **1,314.4**ක වේ. ඒ අනුව **2022** වසර සදහා යොමුකල විදේශීය අරමුදල් සදහාවූ අයදුම්පත්වල වියදම් වටිනාකම රු.මිලියන **1,310.6**ක් වේ. එමෙන්ම දේශීය අරමුදල් වෙනුවෙන් රු.මිලියන**3.85**ක වියදමක් වාර්තා කර ඇත. ඒ අනුව ව්‍යාපෘතිය වෙනුවෙන්රු. මිලියන **1,314.4**ක වියදමක් වාර්තා වී ඇත.
මෙම වෙනසට හේතුවනුයේ **2021** දෙසැම්බර් මස සත්‍ය වශයෙන්ම දරන ලද නමුත් **2021** වසරේ අවසානයට භාණ්ඩාගාරයට යොමු කරන ලද ආපසු ගැනීමේ අයදුම්පත්වල එම වියදම් ඇතුලත් නොවීමත් එම වියදම **2022** වර්ෂයේ යොමුකරන ලද ආපසු ගැනීමේ අයදුම්පත්වල ඇතුලත්වීම හා **2022** දෙසැම්බර් මාසයේ අවසානයට යොමු කරන ලද ආපසු ගැනීමේ අයදුම්පත්වල **2022** වසරේ දෙසැම්බර් වෙනුවෙන් වූ සම්පූර්ණ වියදම ඇතුලත් නොවීමත් යන කරුණු හේතුවෙනි.

## 2.3 .1 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය - ප්‍රගතිය (සංරචක අනුව)

| ආයතනය/ ව්‍යාපෘතිය | | 2022.01.01 2022.12.31 දිනට ප්‍රතිපාදන (රු.මි) | 2022.01.01 2022.12.31 දිනට සත්‍ය වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| විදේශ අරමුදල | | | | |
| සංරචක 1: නියමු භූ දර්ශන සැලසුම් කිරීම් සහ කළමනාකරණය | | | | |
| සංරචක 1 | නියමු භූ දර්ශන සැලසුම් කිරීම සහ කළමනාකරණය | **33.9** | **30.35** | **89.5%** |
| සංරචක 2 ස්වභාවික සම්පත් තිරසර භාවිතය හා මිනිස්-අලි සහජීවනය | | | | |
| උප සංරචක2 (අ ) | ජීවන තත්වය ඉහල නැංවීම සඳහා ස්වභාවික සම්පත් තිරසර භාවිතය | **5.01** | **5.76** | **100%** |
| උප සංරචක2 (ආ) | ජීවනෝපාය ආරක්ෂාව සඳහා අලි-මිනිස් සහජීවනය | **316.95** | **316.85** | **99.9%** |
| සංරචක 3 රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ ආයතනික ධාරිතාව | | | | |
| උප සංරචක 3 (අ) | ආරක්ෂිත සහ කළමනාකරණය ප්‍රදේශ සංරක්ෂණය | **318.48** | **215.93** | **67%** |
| උප - සංරචක 3 (ආ ) | ආරක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය | **180.24** | **65.4** | **36%** |
| උප - සංරචක 3 (ඇ ) | වනජීවී සංරක්ෂණ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු හි ආයතනික ධාරිතාව සහ ආයෝජන හැකියාව වර්ධනය | **516.5** | **614.0** | **100%** |
| සංරචක 4: | ව්‍යාපෘති කළමනාකරණය | **55.0** | **53.2** | **94%** |
| එකතුව | | **1426.0** | **1301.6** | **91.2%** |

## 2.4 දෙපාර්තමේන්තු සංචාරක පැමිණීම හා ආදායම -2022 .12.31 දිනට

| ආයතනය | සංචාරක පැමිණීම | | | ආදායම (රු.මි.) | | | එකතුව (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 810,542 | 301,912 | 1,112,454 | 60.54 | 1220.22 | 583.63 | 1864.40 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 215,778 | 55,579 | 271,357 | 16.01 | 67.23 | *12.50 | 94.31 |
| ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 2,128,035 | 57,596 | 2,185,631 | 338.02 | 133.15 | 63.92 | 535.09 |
| මුළු එකතුව | 3,154,355 | 415,087 | 3569442 | 414.57 | 1420.6 | 660.05 | 2493.8 |

## 2.4.1දෙපාර්තමේන්තුවල සංවර්ධන කාර්යයන්

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව



වනජීවී නීතිය ක්‍රියාත්මක කිරීම



විදුලි වැට අළුත්වැඩියා කිරීම

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව





කෘෂි වන වගා ස්ථාපනය කිරීම



වනාන්තර මැන මායිම් නිරූපණය කර සංරක්ෂිත හෝ රක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කිරීම

- **ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**



දෙහිවල සත්වෝද්‍යානයේ සිංහ අරණ අළුත්වැඩියා කටයුතු



දෙහිවල සත්වෝද්‍යානයේ මැකෝ ගිරවුන් සඳහා

- **රාජ්‍ය දැව සංස්ථාව**



ඉරූ දැව පරිරක්ෂණය කිරීමේ, පදම් කිරීමේ සහ වියලීමේ කටයුතු




දැව සම්බන්ධ තොරතුරු ඇතුලත් මුද්‍රිත ප්‍රකාශයට පත්කිරීමේ කටයුතු සහ දැනුවත් කිරීමේ කටයුතු සිදුකිරීම.

## 2.5 අමාත්‍යාංශයේ විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක

### 2.5.1 විශේෂ ජයග්‍රහණ

- **නව නෙළු විශේෂයක් (*Stabilanthes glandulata*) නකල්ස් රක්ෂිතයෙන් හඳුනා ගැනීම.**
- **වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඇති දීර්ඝ කාලයක් තුල හායනයට පත් වෙමින් පැවති වත්තේගම කැබිලිත්ත රක්ෂිත වනාන්තරයේ හෙක්. 1033ක පැළ සිටුවා රක්ෂිත ප්‍රදේශය ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම.**
- **වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ කළමනාකරණය කරන වනාන්තර 201ක් සඳහා ,වන කළමනාකරණ සැලසුම් සකස් කර අවසන් කිරීම.**
- **ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෘත්තීය පුහුණු නිපුනතා මට්ටම් 3 සහ 4 පිළිබඳ සහතික පත්‍ර ලබාදීමේ ආයතනයක් බවට පත්වීම**
- **රාජ්‍ය දැව සංස්ථාව විසින් කර්මාන්ත අමාත්‍යාංශය හා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය එක්ව සංවිධානය කරන ලද 2022 CNCI ACHIEVER සම්මාන උළෙලේදී රාජ්‍ය නිෂ්පාදන අංශය වෙනුවෙන් "කාර්මික විශිෂ්ටත්වයේ" Achiever සම්මානය දිනා ගන්නා ලදී**
- **රාජ්‍ය දැව සංස්ථාවේ ISO 9001:2015 ප්‍රමිති සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලියේ මූලික අදියර නිමා කරමින් බූස්ස ගෘහ භාණ්ඩ සංකීර්ණ වෙත ISO 9001:2015 ප්‍රමිති සහතිකය ලබා ගන්නා ලදී.**

## 2.5.2 අභියෝග

- රටේ පැවති  කොවිඩ් වසංගත තත්ත්වය හා පවතින ආර්ථික අභියෝග හේතුවෙන් ආදායම් උත්පාදක දෙපාර්තමේන්තු වන වනජීවී, වන සංරක්ෂණ,සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු වල ආදායම් අඩුවීම
- වනජීවී, වන සංරක්ෂණ,සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තුවල පවතින සේවක හිඟය
- දිනෙන් දින වර්ධනය වන අලි මිනිස් ගැටුම විසඳීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත අවශ්‍යවීම, විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේදී මුහුණදීමට සිදුවන ගැටළු, හා මහජන විරෝධතා , විදුලිවැට උපකරණ ආනයනය කිරීමේදී අදාල ආයතනවල සිදුවන ප්‍රමාදවීම්
- වනජීවී අපරාධ මැඩලීම සඳහා යාන්ත්‍රණය ශක්තිමත් කර පවත්වාගෙන යාමේදී ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් බහුල පුහුණු නිලධාරීන් ප්‍රමාණවත් නොවීම
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සිදුකරනු ලබන වගාවන් සඳහා රසායනික පොහොර යෙදීමට ඇති අවකාශය අවම වීම හේතුවෙන් පැළවල වර්ධනයට යම් බලපෑමක් එල්ල වීම.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පයිනස් ඉවත් කිරීමට සැලසුම් කර තිබුණ ද දැව සංස්ථාවේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීමෙන් එය සිදුකර ගත නොහැකි වීම.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්  ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීමේ ගැටලු
- පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව රටවල් අතර සිදුකරනු ලබන සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපහසුවීම හා එමඟින් නව අභිජනනයන් සිදුකිරිමට බාධා ඇතිවීම.
- සත්වෝද්‍යාන තුල සතුන් රඳවා තබාගැනීමට එරෙහිව විවිධ පාර්ශවයන් තුළින් එල්ලවන බලපෑම්වල ප්‍රවණතාවය ඉහළයාම හා විටින් විට වෙනස්වන සත්ත්ව සුභසාධන ප්‍රතිපත්තිවල නොගැලපීම.
- වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනය සහ ජාතික වනජීවී පර්යේෂණ ආයතනයේ සිදුකරන මහා පරිමාණ ඉදිකිරීම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වල මිල අධික ලෙස ඉහල යාම හේතුවෙන් වැඩ අවසන් කිරීමට අභියෝගයක් වීම.
- ආර්ථික අර්බුදකාරී තත්ත්වය යටතේ රාජ්‍ය දැව සංස්ථාවට ගෘහභාණ්ඩ අලෙවි කිරීම පිළිබඳ ගැටළු ඇතිවීම.

### 2.5.3 ඉදිරි ඉලක්ක

- දැනට හායනයට ලක්ව ඇති වන වගා පිළිබඳව සංගණනයක් සිදු කර, එම වන වගා නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩසටහනක් සකස් කිරීම
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින වනාන්තර විද්‍යාත්මක හා කළමනාකරණය සම්බන්ධයෙන් දැනට සකස් කර ඇති සැලසුම් යාවත්කාලීන කිරීම.
- රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කළ වනාන්තර දීර්ඝ කාලීනව සංවර්ධනය කරමින් පවත්වා ගෙන යන ඉඩම් බැහැර කිරීම හා තව දුරටත් වනාන්තර ලෙස සංවර්ධනය කළ හැකි වනාන්තර කොටස් ඇතුලත් වන සේ මායිම් හඳුනාගනිමින් සිතියම් කිරීම.
- දස අවුරුදු මහා වන සැලැස්ම (2020-2030 ) සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම
- 2025 වන විට වන ආවරණය 30% ඉහළ නැංවීමට අදාල ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම හා මාර්ගෝපදේශ සකස් කිරීම
- වනජීවී අපරාධ මැඩලීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේද වැඩිදියුණු කිරීම (GPS,GIS) හා ඒ සඳහා වනසත්ව වෘක්ෂලතා ආඥා පනත සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම මෙන්ම එම පනත වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමත් වනජීවී අපරාධ මැඩලීම සඳහා බුද්ධිමය ඒකකයක් ස්ථාපිත කිරීම
- කි.මී. 1500 ක විදුලි වැට ඉදිකිරීම් කඩිනම් කිරීම හා අලි මිනිස් ගැටුම උග්‍රව පවතින හඳුනාගත් ප්‍රදේශවල ඉලක්ක කර ඇති ගම්මාන වැට සහ කුඹුරු වැට ඉදිකිරීම
- ජාතික උද්‍යානවල යටිතල පහසුකම් සංවර්ධනය හා සංචාරකයින් සඳහා ඉ - සේවාවන් ප්‍රවර්ධනය කිරීම
- පීඩාවට පත්වන සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා වනජීවී සෞඛ්‍ය ඒකක වල පහසුකම් වැඩිදියුනු කිරීම
- රක්ෂිත ප්‍රදේශ අවට ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අදාල අන්තර්ජාතික තත්ත්ව ප්‍රමිති සහතිකය ලබා ගැනීම,අන්තර්ජාතික පරිසර තත්ත්ව ප්‍රමිති සහතිකය ලබා ගැනීම හා හරිත ඵලදායිතා ස්වර්ණ සම්මාන ලබා ගැනීම.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සඳහා නව ආදායම් උත්පාදන වාර්තා ඇති කිරීම.
- රාජ්‍ය දැව සංස්ථාව මගින් පුද්ගලික දැව හා ගෘහභාණ්ඩ නිෂ්පාදන ආයතන සම්බන්ධ කරගනිමින් ගෘහභාණ්ඩ නිෂ්පාදන ප්‍රවර්ධනය කර වෙළඳපොළ පුළුල් කිරීම
- රාජ්‍ය දැව සංස්ථාව මගින් අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගෘහභාණ්ඩ හා අගය එකතු කළ නිෂ්පාදන තුළින් විදේශ විනිමය ඉපැයීමට කටයුතු කිරීම

# 03. පරිච්ඡේදය වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

### 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.000

ඒසීඒ-එෆ්

| අයවැය 2022 | | සටහන | තථ්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | 2022 | 2021 | |
| රු. | | | රු. | රු. | |
| | ආදායම් ලැබීම් | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 92,860,000 | 163,088,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 362,288 | 428,466 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 6,160,425 | 5,316,004 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 99,382,713 | 168,832,470 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 99,382,713 | 168,832,470 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 217,027 | 71,001,124 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 99,165,686 | 97,831,346 | |
| | අඩු කළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | | | |
| 114,650,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 95,243,134 | 74,679,212 | |
| 154,450,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 104,343,802 | 158,956,738 | ඒසීඒ-2 (ii) |
| 600,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 342,329 | 142,723 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 400,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 163,210 | 219,217 | |
| 270,100,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 200,092,475 | 233,997,890 | |

| අයවැය 2022 | | සටහන | තත්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | 2022 | 2021 | |
| රු. | | | රු. | රු. | |
| | මූලධන වියදම් | | | | |
| 7,900,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 4,406,337 | 5,603,674 | |
| 1,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 199,950 | 2,797,481 | |
| | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2 (ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 683,678 | 177,646 | |
| 2,426,700,000 | වෙනත් මූලධන වියදම් | 15 | 2,124,068,975 | 1,448,850,124 | |
| 2,437,100,000 | මුළු මූලධන වියදම් (උ) | | 2,129,358,940 | 1,457,428,925 | |
| | | | | | |
| | තැන්පතු ගෙවීම් | | 286,537 | 348,816 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 9,881,393 | 5,278,742 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 10,167,930 | 5,627,558 | |
| | | | | | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 2,339,619,345 | 1,697,054,373 | |
| | | | | | |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (2,240,453,659) | (1,599,223,027) | |
| | | | | | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (2,240,453,659) | (1,599,223,027) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |
| | | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### 2022.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය | |
|---|---|---|---|
| | | 2022 | 2021 |
| | | රු. | රු. |
| මූල්‍ය නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 205,209,015 | 200,995,929 |
| මූල්‍ය වත්කම් | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 14,566,578 | 10,845,610 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 219,775,593 | 211,841,539 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 14,411,177 | 10,765,960 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 205,209,015 | 200,995,929 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| ජංගම වගකීම් | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 155,401 | 79,650 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | 219,775,593 | 211,841,539 |

පිටු අංක..07....සිට ...44.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...45.... සිට ...57.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023/02/27.

..................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

..........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2023/02/24

ආර්.එම්.සී.එම්. හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය

2

කුමාරසිරි පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරි
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය
නො. 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය

**3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

**2022.12.31 දිනෙන් අවසන් කල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

රු.000

| | තතාය | |
|---|---|---|
| | **2022** | **2021** |
| | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | **49,283,503** | **85,172,356** |
| අග්‍රිම ලැබීම් | **92,860,000** | **163,088,000** |
| අත්තිකාරම් අයකර ගැනීම් | **9,027,977** | **4,863,396** |
| තැන්පතු ලැබීම් | **362,288** | **398,116** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | **151,533,768** | **253,521,868** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | **155,660,949** | **136,077,087** |
| සහනාධාර සහ මාරුකිරීම් | **342,329** | **142,723** |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | **(25,698,646)** | **606,001** |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | **217,027** | **71,001,124** |
| අත්තිකාරම් ගෙවීම් | **11,586,452** | **5,504,571** |
| තැන්පතු ගෙවීම් | **286,537** | **318,466** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | **142,394,648** | **213,649,972** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | **9,139,120** | **39,871,896** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ) | - | - |

රු.000

| | තතය | |
|---|---|---|
| | **2022** | **2021** |
| | රු. | රු. |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | **9,139,120** | **39,871,896** |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | **9,139,120** | **39,871,896** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | **(9,139,120)** | **(39,871,896)** |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ) | **-** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | **-** | **-** |
| විදේශීය ණය ගැනීම් | **-** | **-** |
| ප්‍රදානයන් ලැබීම් | **-** | **-** |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | **-** | **-** |
| විදේශීය ණය ආපසු ගෙවීම් | **-** | **-** |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | **-** | **-** |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | **-** | **-** |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | **-** | **-** |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | **-** | **-** |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

**01.** වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**02.** මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**03.** ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**04.** දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී

**05.** දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**06.** මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

**07.** මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2022 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2021 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (අදාල නොවේ)

රු. , 000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| අදාල නොවේ | | | | | |

## 3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. , 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 270,000 | 270,100 | 200,092 | 74% |
| ප්‍රාග්ධන | 2,110,400 | 2,437,100 | 2,129,358 | 87.37% |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම අංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. , 000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය | උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම | 11,200 | 11,200 | 11,191 | 99.92% |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. , 000

| වත්කම් කේතය | කේත විස්තරය | 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 204,562 | 204,562 | - | 100% |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 647,000 | 647,000 | - | 100% |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

**3.9 විගණකාධිපති වාර්තාව අමුණා ඇත.(පිටු අංක 47-53)**

# 04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

**4.1** ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධන දර්ශක (අමාත්‍යාංශය සහ ආයතන)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතය තත්‍ය නිමැවුම් ලෙස % | | |
|---|---|---|---|
| | **100-90** | **75-89** | **50- 74** |
| විදුලි වැටේ දිග | | √ | |
| ආදායම (රු.මි) | | | √ |
| වසර තුල වන ආවරණය ඉහළ නැංවීමේ ප්‍රතිශතය | | | √ |

# 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

**5.1** හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | **0%-49%** | **50%-74%** | **75%-100%** |
| | | | | | |

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය මෙහෙයවීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරිම අමාත්‍යාංශයේ මෙහෙවර බැවින් තිරසර සංවර්ධන අරමුණු ඉටු කරගැනීමට අවශ්‍ය කාර්යයන් දෙපාර්තමේන්තු හරහා සිදුවේ.

# 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | **31** | **21** | **16** |
| තෘතීයික | **03** | **02** | **01** |
| ද්විතියික | **48** | **65** | **17** |
| ප්‍රාථමික | **18** | **23** | **-05** |

## 6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය

ඉහත සඳහන් පරිදි පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එම නිලධාරීන් ලැබෙන තෙක් සති අන්තයේ සහ කාර්යාල වේලාවෙන් පසුව ද නිලධාරීන් රාජකාරී කටයුතුවල නිරත කරවමින් අමාත්‍යාංශයේ කාර්ය සාධනය පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබයි.

.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

- අමාත්‍යාංශයෙන් පැවැත්වූ පුහුණු වැඩසටහන්

<table>
<tr><th rowspan="2">වැඩසටහනේ නම</th><th rowspan="2">පුහුණු කරන සේවක සංඛාව</th><th rowspan="2">වැඩ සටහනේ කාල සීමාව</th><th colspan="2">සමස්ථ ආයෝජනය (රු. 000)</th><th rowspan="2">වැඩසටහනේ ස්වාභාවය (දේශීය/ විදේශීය)</th><th rowspan="2">නිමැවුම/ලබා ගත් දැනුම*</th></tr>
<tr><th>දේශීය</th><th>විදේශීය</th></tr>
<tr><td>Higher National Diploma in Public Procurement and Contract Administration</td><td>01</td><td>2022.05.12 (මාස 14ක් පැවැත්වේ)</td><td>12,0000</td><td>-</td><td>දේශීය</td><td rowspan="4">විෂය පථයට අදාල දැනුම ලබාගෙන ඇත.</td></tr>
<tr><td>ඵලදායිතා පිළිබඳ පංච් විධ සංකල්පය</td><td>33</td><td>2022.03.15</td><td>14,968</td><td>-</td><td>දේශීය</td></tr>
<tr><td>රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම</td><td>20</td><td>2022.08.17 - 2022.08.18</td><td>35,260</td><td>-</td><td>දේශීය</td></tr>
<tr><td>අමාත්‍යා මණ්ඩල සංදේශ පිළියෙල කිරීම</td><td>01</td><td>2022.09.29 2022.09.30</td><td>8,000</td><td>-</td><td>දේශීය</td></tr>
</table>

| වැඩසටහනේ නම | පුහුණු කරන සේවක සංඛාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු. 000) | | වැඩසටහනේ ස්වාභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය (ඩොලර්) | | |
| පෞද්ගලික ලිපිගොනුවක් ඵලාදායී ආකාරයෙන් පවත්වාගෙන යාම | **02** | **2022..11.09** | **10,000** | - | දේශීය | විෂය පථයට අදාල දැනුම ලබාගෙන ඇත. |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | **01** | **2022.11.15 2022.11.16** | **10,000** | - | දේශීය | |
| විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 02 | 2022.11.21- 2022.11.28 | 20,000 | - | දේශීය | |
| ආයතන සංග්‍රහ හා මුදල් රෙගුලාසි | **07** | **2022.11.28 2022.11.29** | **63,000** | - | දේශීය | |
| හානි පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය | **01** | **2022.12.02** | **10,000** | | | |
| කාර්යක්ෂමතා කඩඉම මත පදනම් වූ වැඩමුළුව | **05** | **2022.12.05** | **11,000** | | | |
| ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | **03** | **2022.12.13** | **15,000** | | | |
| කාර්යාල කාර්ය සහායකයින් සඳහා විනය හා කාර්යාලීය ආචාරවිධි | **09** | **2022.12.22 2022.12.23** | **81,000** | | | |
| General Meeting of Sawen | **01** | **2022.11.01 2022.11.04** | | **225** | | |

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01 | මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූලවේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලවේ | | |
| 1.3 | ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| 2 | පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම.(මු.රෙ.445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූලවේ | | |
| 2.2 | පුද්ගල පඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූලවේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය | අනුකූලවේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූලවේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලිනකර පවත්වාගෙන යාම. | අනුකූලවේ | | |

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **2.8** | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූලවේ | | |
| **2.9** | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **2.10** | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **2.11** | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **03** | මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම **(මු.රෙ.135)** | | | |
| **3.1** | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූලවේ | | |
| **3.2** | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූලවේ | | |
| **3.3** | සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූලවේ | | |
| **3.4** | **2014.05.11** දිනැති අංක **171/2004** දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරිම | අනුකූලවේ | | |
| **4** | වාර්ෂික සැලසුම් සකස් කිරිම | | | |
| **4.1** | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| **4.2** | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **4.3** | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| **4.4** | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| **4.5** | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| **5** | විගණන විමසුම් | | | |
| **5.1** | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |
| **6** | අභ්‍යන්තර විගණනය | | | |
| **6.1** | මු.රෙ. **134(2)** DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණණ සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| **6.2** | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයත් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූලවේ | | |
| **6.3** | **2018** අංක **19** දරණ ජාතික විගනන පනතේ **40(4)** උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **6.4** | මුදල් රෙගුලාසි **134(3)** ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **7** | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| **7.1** | DMA චක්‍රලේඛ **1-2019** අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු **04** ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූලවේ | | |

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරිම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූලවේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම | අනුකූලවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම | අනුකූලවේ | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලකයකදී අපහරණය කර තිබීම | අනුකූලවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූලවේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයට අයත් වාහන අතරින් වාහන 07ක් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වාහන වේ<br><br>එම වාහන 07 අතරින් වාහන 6ක පරම අයිතිය අහෝසි කර ඇත | එක් වාහනයක වර්තමාන අයිතිකරු වන්නේ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වන බැවින්, එම අමාත්‍යාංශය මගින් අදාළ වාහනය මෙම අමාත්‍යාංශය වෙත පවරා දීමට කටයුතු සිදුකර නොමැත. |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලවේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූලවේ | | |

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූලවේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූලවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 13 | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූලවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 14 | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූලවේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 14.3 | මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූලවේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූලවේ | | |
| 15 | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාළ නොවේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාළ නොවේ | | |

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **16** | මානව සම්පත් කළමනාකරණය | | | |
| **16.1** | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **16.2** | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූලවේ | | |
| **16.3** | **2017.09.20** දිනැති MSD චක්‍රලේඛ අංක **04/2017** ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **17** | මහජනයා වෙත තොරතුරු ලබාදීම | | | |
| **17.1** | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **17.2** | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූලවේ | | |
| **17.3** | තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන හා **10** වන වගන්ති ප්‍රාකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **18** | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| **18.1** | අංක **05/2008** හා **05/2018(1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූලවේ | | |

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූලවේ | | |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූලවේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූලවේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූලවේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරිම ,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූලවේ | | |
| 20 | විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූලවේ | | |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එෆ්ඩබ්ලිව්/බී/ඩබ්ලිව්එෆ්/06/22/10 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2023 මැයි 22 දින |

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

**ශීර්ෂය 161 - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වගණනය කළ මතය

ශීර්ෂය 161 - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
| --- | --- |
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ විධිවිධානවලින් බැහැරව ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්විය යුතු රු.37,074,415ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | 1.6.1 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පුනරාවර්තන වියදම්

භෞතික වත්කම් පුනරුත්ථාපනය සඳහා දරන ලද මෙහෙයුම් වියදම් රු.8,939,169ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වනු වෙනුවට භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම වශයෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 16 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය.

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විදේශ ආධාර ව්‍යාපෘති - පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය ව්‍යාපෘතිය (ESCAMP)

2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඇමරිකානු ඩොලර් මිලියන 45 ක ලෝක බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු මෙම ව්‍යාපෘතිය පසුව ඇමරිකානු ඩොලර් මිලියන 35 ක් ලෙස සංශෝධනය කර තිබුණු අතර සැලසුම් කරන ලද ආකාරයට කටයුතු අවසන් නොවීම හේතුවෙන් 2023 මැයි 31 දින දක්වා ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2023 පෙබරවාරි 28 දින වන විට ව්‍යාපෘතිය සඳහා වෙන් කළ රු. මිලියන 8,013 ක මුළු ප්‍රතිපාදනයෙන් සත්‍ය වියදම රු. මිලියන 5,981 ක් විය.

(අ) පරිසර පද්ධතිවල කළමනාකරණය වැඩි කිරීම තුළින් එම පරිසර පද්ධති සංරක්ෂණය කර එමගින් ජනතාවට ප්‍රතිලාභ අත්පත් කර ගැනීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වුවද, ජීවගෝලයන් වැඩි දියුණු කිරීම හා සුරක්ෂිත කිරීම සඳහා ස්වභාවික සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම හා අලි මිනිස් සහජීවනය ඇති කිරීම, රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය හා කළමනාකරණය සහ රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය නගා සිටු වීම යනාදී පරිසර සංරක්ෂණය සඳහා අතිශය වැදගත් වන ව්‍යාපෘති සංරචකයන් සඳහා රු.මිලියන 3,117 ක් වන සියයට 38 තරම් අඩු ප්‍රතිපාදනයක් ද, ආයතන කුසලතාවය හා ආයෝජන ධාරිතාව වැඩිකිරීම සඳහා රු.මිලියන 4,386 ක් හෙවත් සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 55 ක් ද වෙන් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා රු.මිලියන 0.72 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මොණරාගල දිස්ත්‍රික්කයේ රතුගල ප්‍රදේශයේ පවුල් ඒකක 105 ක ජීවන තත්ත්වය නගා සිටුවීමේ ක්‍රියාකාරකම් 05 ක් අත්හැර දමා තිබුණු අතර රු.මිලියන 232.93 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් කර තිබූ තවත් කාර්යයන් 09 ක් නිම කිරීමට නොහැකි වී තිබුණි. තවද, උඩවලව ජාතික උද්‍යානය හරහා එක් පවුලක් සඳහා පර්චස් 80 ක බුලත් වගා කිරීමට පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ රු.මිලියන 0.770 ක් වැය කර පවුල් ඒකක 14 ක් වෙත ලබා දී තිබුණු බුලත් පැළ රෝගයකට ගොදුරු වී අස්වැන්න ලබා ගැනීමට ප්‍රථම විනාශ වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය හා කළමනාකරණය යටතේ රු.මිලියන 61.5 ක ප්‍රතිපාදන මගින් නිම කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 07 ක භෞතික ප්‍රගතිය සියයට 32 ත් සියයට 65 ත් අතර ද, රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය නගා සිටු වීම යටතේ රු.මිලියන 100 ක ප්‍රතිපාදනයෙන් සිදුකළ ඉදි කිරීමේ කාර්යයන් 02 ක භෞතික ප්‍රගතිය සියයට 40 ක් ද විය.

(ඇ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතනික ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරනු ලබන මූලික ඇස්තමේන්තුව රු. මිලියන 1,913 ක් වූ ව්‍යාපෘති 06 ක, කොන්ත්‍රාත් අත්හිටුවා නැවත රු.මිලියන 1,738 කට නව ව්‍යාපෘති වශයෙන් 2023 මැයි 31 දින අවසන් කිරීමට පවරා තිබුණි. ඒ අනුව එම ව්‍යාපෘති සඳහා මූලික ඇස්තමේන්තුව ඉක්මවා අධික පිරිවැයක් වැයවන බවට නිරීක්ෂණය කෙරේ.

(ඈ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 30 දෙනෙකු සඳහා කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලද ශ්‍රී ලංකා සුදුසුකම් මාර්ගෝපදේශ (SLQF) 3 වන ස්ථරයට අයත් වනජීවී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2017/2018 කණ්ඩායම සඳහා අයකළ පාඨමාලා ගාස්තුව රු.3,300,000 ක් වුවද, 2019/2020 කණ්ඩායම සඳහා ඊට වඩා රු.11,700,000 ක් වැඩියෙන් රු.15,000,000 ක ගාස්තුවක් අයකර තිබුණු අතර මෙම පාඨමාලාව සඳහා වැයකළ මුළු මුදල රු.38,819,579 ක් විමෙන් එක් නිලධාරියෙකු වෙනුවෙන් වැයකළ මුදල රු.1,293,333ක් වී තිබුණි. එම විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලද SLQF 8 වන ස්ථරයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ එක් සිසුවෙකුගේ ගාස්තුව රු.250,000 ක් වීමත්, කොළඹ විශ්ව විද්‍යාලය තෝරාගැනීමේදී ලෝක බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබීමත්, විශ්ව විද්‍යාලයට ගෙවූ රු.21,590,108කට අදාළ ඉන්වොයිසිවල මුල් පිටපත් හා රු.12,785,500 ක අත්තිකාරම් පියවීමට අදාළ වවුචර්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබීමත් යනාදී කරුණු අනුව ද මෙය අරපිරිමැස්මකින් යුතු ගනුදෙනුවක් බවට නිරීක්ෂණය කළ නොහැකි විය.

3.2 පාඩු හා හානි

------------

වාහන අනතුරු සඳහා රක්ෂණ සමාගම්වලින් අය කර ගෙන තිබූ එකතුව රු.887,554 ක් වූ අලාභයන් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ අය කර ගැනීම් ලෙස සඳහන් නොකර පොතෙන් කපා හළ අගයන් ලෙස දක්වා තිබුණි.

3.3 අනාර්ථික ගනුදෙනු

--------------------

2016 ජූනි 01 දින සිට මහල් හයකින් යුතු සිනෙෆ් ලංකා ගොඩනැගිල්ලේ මහල් 04 ක වර්ග අඩි 22,522 ක වපසරියක වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන අතර 2021 මැයි මස 31 දින කිවිසුම්ගත කාලය අවසන් වීම නිසා 2021 ජූනි මස 01 දින සිට 2023 මැයි 31 දින දක්වා වසර 02 ක කාලයක් සඳහා කැඳවූ මිල ගණන් අනුව ඒ ආසන්නයේ පිහිටි ගොඩනැගිල්ලකින් ලැබී තිබුණු රු.121,618,800 ක මිල ගණන් නොසලකා ඊට වඩා රු.18,561,425ක් වැඩියෙන් රු.140,180,225 කට කැබිනට් මණ්ඩල අනුමැතිය යටතේ නැවත වරක් මෙම ගොඩනැගිල්ලම කුලියට ගෙන තිබුණි. තවද,

එම ගොඩනැගිල්ල සඳහා රජයේ මාසික තක්සේරුව රු.8,100,000 ක් වුවද, ඊට වඩා රු.4,383,593 ක් වැඩියෙන් රු.12,483,593 ක මාසික කුලියක් එම ගොඩනැගිල්ලට ගෙවා තිබුණු අතර අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා රජයේ ගොඩනැගිලිලකින් ඉඩකඩ පහසුකම් වෙන්කර ගැනීමට ප්‍රමාණවත් ආකාරයට කටයුතු කර ඇති බවට ද නිරීක්ෂණය නොවීය.

4. මානව සම්පත් කළමනාකරණය

---

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 148 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 110 ක් විය. ඒ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් ඇතුළුව තනතුරු 38 ක් පුරප්පාඩු වී පැවතුණි.

ආර්.එම්.එම්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ආර්.එම්.එම්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත් : අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මිණුම් දෙපාර්තමේන්තුව